"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000

| මගේ අංකය. / எனது இல. / My No. | CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2019-02-01 |
|---|---|---|---|---|---|

**පළාත් චක්‍රලේඛ : 06/2019**

ආණ්ඩුකාර ලේකම්(බ.ප),

සභා ලේකම්(බ.ප),

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),

පරිපාලන නිලධාරි(පාලන),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට/ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම.**

සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට පහත කොන්දේසි යටතේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ අන්තර්ග්‍රහණයෙන් පසුව බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අනුයාත විභග අවස්ථා 06ක සහන කාලයක් ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව 2018.06.04 දිනැතිව නිකුත් කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 02/2018 මඟින් දැනුම් දී ඇත. ඒ අනුව එය බස්නාහිර පළාත් සභාවට මෙලෙස අනුගත කර ගෙන ඇත.

02. ඒ අනුව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට/ III වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම/ සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම හේතුවෙන්;

i. පරිවාස කාලය දීර්ඝ කළ/ වැටුප් වර්ධක විලම්භනය වූ නිලධාරීන් ද
ii. ඒ හේතුවෙන් සාමාන්‍ය කාර්ය සාධනය මත II වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය ජ්‍යෙෂ්ඨත්වයට බලපාන පරිදි දීර්ඝ කළ පරිවාස කාලය/ විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය මත II වන ශ්‍රේණියේ උසස්වීම (අංක 1385/10 හා 2005.03.23 දිනැති

අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 2013.04.02 දින සිට ක්‍රියාත්මක අංක 1898/05 හා 2015.01.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 10.1 වගන්තිවල සඳහන්) <u>පමණක්</u> යථාවත් කර ගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. මෙය අතීතයට ද බලපාන පරිදි සිදු කරනු ලබන සහන සැලසීමක් වන හෙයින් ද අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණු වලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද පහත දක්වා ඇති අහිමි වූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමි වීමට පෙර සිදු වූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ, වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (අංක 1385/10 හා 2005.03.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 2005.03.23 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.2 හෝ 12.2 වගන්ති යටතේ සඳහන් හෝ වෙනත්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/ සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමි වීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා
ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා
iii. මෙම සහනය හිමි වීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය වීම හඳුනා නොගෙන/ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේදී හෝ වෙනයම් පසු අවස්ථාවකදී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම්/ වරප්‍රසාද ලබා ගැනීමට ඉදිරිපත් කරන අභියාචනා

04. 2003.05.01 දිනට පෙර සෞඛ්‍ය ලිපිකාර සේවයේ II 'ආ' ඛණ්ඩයට බඳවා ගන්නා ලද 2003.05.01 දින සිට සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට ද 2003.05.01 දින සිට මෙම චක්‍රලේඛය යටතේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා මෙමගින් අනුයාත විභාග අවස්ථා 06ක් හිමි වන නමුත්, එදිනට එනම් 2003.05.01 දිනට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම සම්බන්ධයෙන් වූ කිසියම් වැටුප් වර්ධක විලම්භනයක් වේ නම් එය එසේම පවතිනු ඇති අතර මෙමඟින් ඊට සහනයක් හිමි නොවනු ඇත.

05. තවද ඉහත සඳහන් අනුයාත විභාග අවස්ථා 06 ගණනය කිරීමේදී ප්‍රාථමික/ III වන ශ්‍රේණියට පත් වූ දින සිට පැවැත්වූ පූර්ව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය යටතේ ලද විභාග අවස්ථා ද පසුව බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය යටතේ ලද විභාග අවස්ථා ද ඇතුළුව සේවාවන් දෙකෙහිම III වන පන්තියට අදාළ අනුයාත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විභාග අවස්ථා ගණන 06ක් විය යුතු අතර එය ඉක්මවා යාමට මෙමගින් අවස්ථාවක් හිමි නොවනු ඇත.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

<u>*පිටපත*</u> : 01. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.